# ගම නැගුමට කෙතට අරුණ

## ප්‍රජා සැලසුම් සකස් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන

2006 මාර්තු 15 -18

## ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තාව

(අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඩියන්ගල්ල හා පුලියන්කුලම ගම්මාන සඳහා සකස් කෙරින.)


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා

පුහුණුකිරීමේ ආයතනය

114 විජේරාම මාවත

කොළඹ 07



711.3
(SL)
හෙක්ට

21245

2009/06 2010/04

250/=

# ගම නැගුමට කෙතට අරුණ

## ප්‍රජා සැලසුම් සකස් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන

2006 මාර්තු 15 -18

### ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තාව

(අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඩියන්ගල්ල හා පුලියන්කුලම ගම්මාන සඳහා සකස් කෙරුණ.)


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත
කොළඹ 07



MFN 18798

21245

21245

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

| පටුන | පිටුව |
|---|---|


| | | |
|---|---|---|
| පටුන | | 1 |
| වගු සටහන් | | 11 |
| රූප සටහන් | | 111 |
| 01 | හැඳින්වීම | 1 |
| 1.1 | පිවිසුම | 1 |
| 1.2 | පුහුණු වැඩසටහන | 2 |
| 1.3 | අරමුණු | 2 |
| 1.4 | පුහුණු ලාභීන් | 3 |
| 1.5 | ක්ෂේත්‍ර අභ්‍යාස | 3 |
| 02 | කඩියන්ගල්ල ගම්මානය | 4 |
| 2.1 | ගමේ පිහිටීම | 4 |
| 2.2 | ගමේ ඉතිහාසය | 4 |
| 2.3 | යටිතල පහසුකම් | 4 |
| 2.4 | ප්‍රජා සංවිධාන | 5 |
| 2.5 | ජනගහණය | 5 |
| 2.6 | අධ්‍යාපන මට්ටම | 6 |
| 2.7 | රැකියා ස්වභාවය හා ජීවන මාර්ග | 6 |
| 2.8 | නිවාසවල තත්ත්වය හා උපකරණවල අයිතිය | 7 |
| 2.9 | සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් | 7 |
| 2.10 | ඉඩම් අයිතිය හා භුක්තිය | 7 |
| 2.11 | කෘෂිකාර්මික කටයුතු හා සත්ව පාලනය | 7 |
| 2.12 | ගමේ සම්පත් හා ප්‍රවනතා විශ්ලේෂණය | 9 |
| 2.13 | කඩියන්ගල්ල ගමේ හඳුනාගත් ප්‍රධාන කෘෂිකාර්මික ගැටලු | 9 |
| 2.14 | ක්‍රියාකාර් සැලැස්ම - කඩියන්ගල්ල ගම | 18 |
| 2.14.1 | වී වගාව - කඩියන්ගල්ල ගම | 18 |
| 2.14.2 | අතිරේක බෝග - කඩියන්ගල්ල ගම | 19 |

03 පුලියන්කුලම ගම්මානය 21

3.1 ගමේ පිහිටීම 21
3.2 ඉතිහාසය හා කාල රේඛාව 21
3.3 ජනගහණය හා අධ්‍යාපනය 22
3.4 රැකියා සහ ආදායම් තත්ත්වය 23
3.5 කෘෂිකාර්මික කටයුතු 23
3.6 මාර්ග පද්ධතිය හා භෞතික යටිතල පහසුකම් 24
3.6.1 මාර්ග පද්ධතිය 24
3.6.2 භෞතික යටිතල පහසුකම් 24
3.6.2.1 ජල සම්පාදන ක්‍රම (කෘෂිකාර්මික කටයුතු සඳහා) 25
3.6.2.2 ජල සම්පාදන ක්‍රම (සාමාන්‍ය භාවිතය) 25
3.6.2.3 නිවාස හා වැසිකිලි පහසුකම් 25
3.6.2.4 කෘෂි උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා වාහන 25
3.7 ඉඩම් පරිහරණය හා භුක්තියේ ස්වරූපය 26
3.8 ප්‍රජා සංවිධාන 26
3.9 පුලියන්කුලම ගම්මානයේ හඳුනාගත් ගැටළු 34
3.10 ව්‍යාපෘති සැලැස්ම - පුලියන්කුලම 37

වගු සටහන්

2.1 ගමට සේවා සපයන ආයතනවල සිතියම 05
2.2 ජනගහණය වයස් කාණ්ඩ අනුව බෙදී ඇති ආකාරය 06
2.3 රැකීරක්ෂා 06
2.4 සාමාන්‍යයෙන් වසරක් තුළ දී වගා කරන හේන් බෝග වර්ග හා ඉන් ලැබෙන අස්වනු ප්‍රමාණයන් 08
2.5 සත්ව පාලනයේ යෙදී සිටින පවුල් සංඛ්‍යාව සහ සතුන් ප්‍රමාණය 08

3.1 වයස් ව්‍යුහය අනුව ජනගහණ ව්‍යාප්තිය - පුලියන්කුලම 22
3.2 ආංශික සේවා නියුක්තිය - පුලියන්කුලම 23
3.3 ඉඩම් අයිතිය බෙදී ඇති ආකාරය 26

## රූප සටහන් හා ඇමුණුම්

### රූප සටහන්


1. කඩියන්ගල්ල ගමේ ප්‍රවනතා විශ්ලේෂණය 9
2. හඳුනාගත් ගැටළු පිළිබඳ ද්විත්ව යුගල සැසඳීම 10
3. සමිති සමාගම්වල සාමාජිකත්වය 11
4. කඩියන්ගල්ල ගමට සේවා සපයන රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන 12
5. වර්ෂාපතන රටාව - කඩියන්ගල්ල 13
6. වාර්ෂික උෂ්ණත්වය - කඩියන්ගල්ල 13
7. වගා කාලසටහන 14
8. කඩියන්ගල්ල හරස්කඩ වාර්තාව 15
9. කඩියන්ගල්ල ගැටළු ගස 16
10. කඩියන්ගල්ල අරමුණු ගස 17
11. කඩියන්ගල්ල ගමෙහි සිතියම 20
12. ගමෙහි පිහිටි ප්‍රජා සංවිධාන මගින් ගමට සිදුවන සේවය දැක්වෙන වෙන් රූප සටහන - පුලියන්කුලම ගම 27
13. ගමට සේවා සපයන ආයතන දැක්වෙන වෙන් රූප සටහන 28
14. බෝග වගා කාල සටහන - පුලියන්කුලම 29
15. උෂ්ණත්වය හා වර්ෂාපතනය - පුලියන්කුලම 30
16. හරස්කඩ වාර්තාව - පුලියන්කුලම 32
17. ගම්මාන සිතියම - පුලියන්කුලම 32
18. ප්‍රවනතා විශ්ලේෂණය - පුලියන්කුලම 33
19. හඳුනාගත් ගැටළු සඳහා යුගල සැසඳීම 34
20. ගැටළු ගස - පුලියන්කුලම 35
21. අරමුණු ගස - පුලියන්කුලම 36


### ඇමුණුම්


1. සම්පත්දායකයින්ගේ නාම ලේඛනය 38
2. පුහුණු ලාභීන්ගේ නම් හා ලිපිනයන් 40
3. ක්ෂේත්‍ර අධ්‍යයනය පැවැත්වූ ගම්මාන අනුව සහභාගි වූවන්ගේ නාමලේඛනය 42

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පිවිසුම

ශ්‍රී ලංකාවේ ගම්මාන පහලොස් දහසක් සැලසුම් සහගත ලෙස සංවර්ධනය කිරීම වර්තමාන රජය විසින් අරඹා ඇති එක් දැවැන්ත සංවර්ධන වැඩසටහනකි. මේ යටතේ පිහිටුවීමට යෝජිත "ග්‍රාම සභා" තුලින් මෙම "ගම නැගුම" සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. මෙම "ගම නැගුම" සංකල්පයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය සඳහා ඔවුන්ගේ ද අත්දැකීම් මුසු කරමින් සැබෑ සැලසුම්කරණයක් කොට එම සැලසුම් ක්‍රියාත්මක කිරීමෙහිලා ඔවුන් ද කොටස් කරුවන් කර ගැනීමයි.

සංවර්ධනය තිරසර එකක් වීමට නම් එය ජන සහභාගිත්වයෙන් සිදු කළ යුතු බව අද පුළුල් වශයෙන් පිළිගත් සත්‍යයකි. සැලසුම්කරන අවධියේ සිට ප්‍රතිලාභ භුක්ති විඳීම දක්වා වූ සෑම අවධියකදී ම ජනසහභාගිත්වය මෙහිදී බලාපොරොත්තු වේ. අද බොහෝ රටවල ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වලදී සංවර්ධනයේ තිරසාර භාවය සඳහා අනිවාර්ය අංගයක් ලෙස ජන සහභාගිත්වය ලබා ගැනීම සිදුවන්නකි.

ඕනෑම සංවර්ධන වැඩසටහනක දී ප්‍රථම කාර්යය ලෙස කළ යුත්තේ ඒ සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කිරීමයි. ග්‍රාමීය/ප්‍රජා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගම්වලින් තොරතුරු රැස් කිරීම සඳහාත් සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සලසන ආයතන හා ප්‍රජාවන් අතර ක්‍රමවත් හා නිසි සංනිවේදන ක්‍රියාවලියක් ගොඩනැගීම සඳහාත් විවිධ ක්‍රම අනුගමනය කරයි. මෙයින් වඩාත් උචිත ක්‍රමෝපායයක් ලෙස "සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය" (PRA) වඩාත් ජනප්‍රිය වූවකි. එබැවින් මේ පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුමක් ග්‍රාමීය සංවර්ධන කටයුතුවල නියැලෙන ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබා දීම ඉතා වැදගත් කරුණකි.

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 70% ක්ම ග්‍රාමීයව ජීවත් වන අතර ඉන් බහුතරයක් කෘෂිකර්මය හා අදාල ක්ෂේත්‍රයන්ගෙන් ජීවනෝපාය සලසා ගනී. එබැවින් "ගම නැගුම" වැඩසටහන තුලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සංවර්ධනයට මූලික තැනක් දී කටයුතු කළයුතු බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. ග්‍රාමීය ගොවිජනතාව මුහුණ දී ඇති ප්‍රධාන ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම සඳහා ක්‍රමවත් සැලසුම් සකස් කිරීම මෙහිලා වැදගත් වේ. ග්‍රාමීය ගොවි ජනතාවගේ සැබෑ ප්‍රශ්නයන් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවයන් මත සැලසුම් සකස් කිරීම සිදුවිය යුතුය. මේ සඳහා ඔවුන්ට අවශ්‍ය වන නව දැනුම ඔවුන් වෙත ලබාදිය යුතුව ඇත. ඔවුනට එම දැනුම ලබා දීම ඉලක්ක කරගත් ප්‍රජා ක්‍රියාකාර සැලසුම් සකස් කිරීම පිළිබඳ

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය මගින් අරඹා ඇත. මෙය එම වැඩසටහන් මාලාවේ හතරවන වැඩසටහනයි.

## 1.2 පුහුණු වැඩසටහන

සහභාගිත්ව ගැමි පිරිසුම් ක්‍රමය (PRA) පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලී සිටින නිලධාරීන් වෙත ලබා දීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් පුහුණු වැඩසටහන් රාශියක් සැලසුම් කර ඇති අතර, ඉන් හතරවැන්න 2006 මාර්තු මස 15 දින සිට 18 දින දක්වා මහඉලුප්පල්ලම කෘෂිකර්ම දෙපාර්තමේන්තු සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ දී පවත්වනු ලැබීය. කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන මෙම පුහුණු වැඩසටහන් සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මූල්‍ය අනුග්‍රහය දක්වයි. මේ යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන නියෝජනය කරමින් ආචාර්ය මර්වින් ජෝශප් හා වෛද්‍ය රත්නායක යන මහත්වරුන් සම්පත් දායකයින් ලෙස මෙම වැඩසටහනට සහභාගි විය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සම්පත් දායකයින් හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීමට අමතරව පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කිරීමටත්, එය සාර්ථක කරගැනීමටත් කටයුතු කලේය. (සම්පත් දායකයින්ගේ නාම ලේඛනය සඳහා ඇමුණුම 1 බලන්න)

## 1.3 අරමුණ

"ගම නැගුමට කෙතට අරුණ" යන තේමාව යටතේ ජන සහභාගිත්වය තුලින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාර සැලසුම් සකස් කිරීම පිළිබඳ මූලික සංකල්ප හා විධි ක්‍රම පිළිබඳව පුහුණුවන්නන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

වැඩසටහනෙහි විශේෂිත අරමුණ වූයේ වැඩසටහන අවසානයේ දී පුහුණු වන්නන් හට

- ජන සහභාගිත්ව සංකල්පය විස්තර කිරීමට හා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී එහි ඇති වැදගත්කම හඳුනාගැනීමට.
- ගෘහස්ත ආදායම වැඩි කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රමෝපායන් හඳුනා ගැනීමට
- ජාතික කෘෂිකර්ම සංවර්ධන වැඩසටහනේ ග්‍රාමීය දායකත්වය කුමක්දැයි විස්තර කිරීමට
- ගමේ ඇති සම්පත් හඳුනා ගන්නා අයුරු විස්තර කිරීමට
- දත්ත එකතු කිරීමේ විවිධ ක්‍රම මොනවාද යන්න ලැයිස්තු ගත කිරීමට
- ව්‍යාපෘති චක්‍ර කළමනාකරණ සංකල්පය කුමක්දැයි විස්තර කිරීමට
- නායකත්ව ස්වභාවයන් 04 ක් නම් කිරීමට

- ග්‍රාම සංවර්ධනයට බලපෑ හැකි ගැටලු හඳුනාගැනීම, ඒවා පෙළගැස්වීම හා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීමට හා
- ප්‍රජා ක්‍රියාකාරී සංවර්ධන සැලැස්මක් නිවැරදිව සකස් කිරීමට

හැකියාව ලබා දීමයි.

## 1.4 පුහුණු ලාභීන්

වැඩසටහන සඳහා කුරුණෑගල, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරු හතරදෙනෙක් ද, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු හතරදෙනෙක් ද, කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයෙක් ද, ප්‍රාදේශීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු තිදෙනෙක් ද, විෂයභාර නිලධාරීන් දහදෙනෙක් ද, කෘෂිකර්ම නිලධාරී වරයෙක් හා කෘෂි උපදේශක වරුන් පස් දෙනෙක් ද සහභාගි වූහ. (පුහුණු ලාභීන්ගේ නාම ලේඛනය ඇමුණුම අංක 02 හි දැක්වේ)

## 1.5 ක්ෂේත්‍ර අභ්‍යාස

වැඩසටහන තුලින් පුහුණු ලාභීන් න්‍යායාත්මකව දැනුවත් වූ සහභාගිත්ව සංවර්ධන විධි ක්‍රම ප්‍රායෝගිකව අත්හදා බැලීමට අවස්ථාවක් සැලසීම සඳහා ක්ෂේත්‍ර අභ්‍යාසයක් සිදු කරනු ලැබීය. එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීයලේකම් කොට්ඨාශයේ කඩියන්ගල්ල හා පුලියන්කුලම යන ග්‍රාම නිලධාරී වසම් තුල පිහිටි කඩියන්ගල්ල හා පුලියන්කුලම යන ගම්මානවල මාර්තු මස 17 දින සිදු කරනු ලැබීය. (ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා සහභාගි වූවන්ගේ නාම ලේඛනය ඇමුණුම අංක 3 හි දැක්වේ.) වැඩසටහන අවසානයේ දී මෙම ගම්මාන දෙක පදනම් කරගෙන සකස් කරන ලද ප්‍රජා සංවර්ධන සැලැස්ම ද, රැස්කළ තොරතුරු හා අනෙකුත් සොයාගැනීම් ඇතුලත් වාර්තා ද මෙහි අඩංගු වේ.

## දෙවන පරිච්ඡේදය

## කඩියන්ගල්ල ගම්මානය

### 2.1 ගමේ පිහිටීම

කඩියන්ගල්ල ගම්මානය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඩියන්ගල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති ගම්මානයකි. කැකිරාව - එප්පාවල මාර්ගයේ ගෝනපතිරාව නගරයෙන් වමට හැරී ඇති ගුරු පාර දිගේ කි.මී. 01 ක් පමණ ගිය විට හමුවන ජයගඟ පසුකල විට එයට මායිම්ව කඩියන්ගල්ල ගම පිහිටා ඇත.

### 2.2 ගමේ ඉතිහාසය.

මෙම ගම පුරාණ ගමකි. පුරාණයේ මේ ප්‍රදේශයේ හේන් වගා කරමින් ජීවත් වූ පවුල් වලින් ආරම්භ වූවකි. දැනට මේ ගමේ පදිංචි පවුල් සංඛ්‍යාව 126 කි. ගමට මායිම්ව පිහිටි ජයගඟ මහවැලි ව්‍යාපාරය යටතේ ඉදි කරන ලද්දක් වන අතර, එය විශේෂයෙන්ම මෙම ගමේ ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා ඉදිකරන ලද්දක් නොවන්නකි.

කාල රේඛාව

1. ගමේ ආරම්භය - 1905
2. ගමට මුලින්ම තිබූ නම - කඩුවකෙටුගල
3. ගමට යන කරත්ත පාර ඇරඹීම - 1963
4. කෘෂිකර්ම කටයුතු සඳහා ට්‍රැක්ටර් භාවිතය ආරම්භය - 1970
5. ජයගඟ ප්‍රධාන ඇල කැපීම - 1977
6. මරණාධාර සමිතිය ඇරඹීම - 1984
7. ගොවි සමිතිය ඇරඹීම - 1994
8. ගොයම් පැගීම සඳහා ඇග්‍රිමෙක් භාවිතය - 2003
9. අලුත් බීජ වර්ග ව්‍යාප්ත වීම - 2003

### 2.3 යටිතල පහසුකම්

ගෝනපතිරාව නගරයේ සිට මෙම ගමට ලඟා වන මාර්ගය ගුරු පාරකි. මේ ගම හරහා ප්‍රධාන විදුලි මාර්ගය යෙදී ඇති බැවින් ගමේ විශාල කොටසකට විදුලි බල පහසුකම් ඇත. විහාරස්ථානයක් ද, ග්‍රාම නිලධාරී හා සමෘද්ධි නිලධාරීන් හමුවන කාර්යාල ගොඩනැගිල්ලක් ද ගමේ පිහිටා ඇත. මහවැලි ව්‍යාපාරය යටතේ ඉදි කරන ලද ජයගඟ මේ ගම ආසන්නයෙන් ගලා ගියත් එමගින් මෙම ගමෙහි ඉඩම් පෝෂණය නොවේ. ගමේ කුඩා වැව් දෙකක් පිහිටා ඇත. නිවෙස්වලට නල ජල පහසුකම් නොමැත.

පානීය ජලය ලබා ගනුයේ ගෘහස්ථව ඉදි කර ඇති ළිං වලිනි. බොහෝ ගම්වැසියන් නෑම සඳහා ජය ගඟ භාවිතා කරයි. ගමට සේවා සපයන රාජ්‍ය ආයතන බොහොමයක් පිහිටා ඇත්තේ ගමෙන් පිටතය.

2.1 වගුව. ගමට සේවා සපයන ආයතනවල පිහිටීම

| ආයතනය | පිහිටීම | ගමේ සිට දුර (කි.මී.) |
|---|---|---|
| සමුපකාර ප්‍රාදේශිකය | ගමෙන් පිට | 03 |
| රෝහල | ගමෙන් පිට | 08 |
| ඉන්ධනහල | ගමෙන් පිට | 15 |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | ගමෙන් පිට | 07 |
| බැංකුව | ගමෙන් පිට | 03 |
| කිරි එකතුකිරීමේ මධ්‍යස්ථානය | ගමෙන් පිට | 04 |
| පාසල | ගමෙන් පිට | 06 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

2.4 ප්‍රජා සංවිධාන.

මෙම ගමෙහි ප්‍රජා සංවිධාන කිහිපයක්ම පිහිටුවා ඇත. ඉන් ප්‍රධාන තැනක් ගන්නේ මරණාධාර සමිතියයි. එමෙන්ම එය හොඳින් ක්‍රියාත්මක වන සමිතියකි. ඊට අමතරව ගොවි සංවිධානය ද වැඩිම සාමාජික පිරිසක් සිටිනා සමිතියක් වුවද එය එතරම් ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. සමෘද්ධි සමිතිය සාමාජිකයන් 40 දෙනෙකුගෙන් සමන්විත වූවකි. ගමේ ක්‍රියාත්මක ප්‍රජා සංවිධාන පිළිබඳව අදහස් රූප සටහන් අංක 01න් පෙන්වා දෙයි.

2.5. ජනගහණය.

ග්‍රාම නිලධාරීගේ වාර්තා දක්වන පරිදි පවුල් සංඛ්‍යාව 126 ක් වූ මේ ගමේ මුලු ජනගහණය 388 කි. ඉන් බහුතරයක් (209) ක් ස්ත්‍රීන් වන අතර. පුරුෂයින් 179 කි. ගමේ සියලුදෙනාම සිංහල බෞද්ධ ජන කොටසට අයත් වෙති. ගමේ ජනගහණය වයස් කාණ්ඩ වශයෙන් බෙදී ඇති අන්දම අංක 02 දරණ වගුවෙන් පෙන්වා දෙයි.

2.2 වගුව : ජනගහණය වයස් කාණ්ඩ අනුව බෙදී ඇති ආකාරය

| වයස් කාණ්ඩය (අවුරුදු) | 0-5 | 6-11 | 12-17 | 18-25 | 26-35 | 36-55 | 56-60 | 61-70 | 70 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | 15 | 17 | 31 | 37 | 37 | 55 | 05 | 07 | 05 | 209 |
| පුරුෂ | 10 | 16 | 15 | 37 | 29 | 56 | 04 | 07 | 05 | 179 |
| එකතුව | 25 | 31 | 46 | 74 | 66 | 111 | 09 | 14 | 10 | 388 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

2.6 අධ්‍යාපන මට්ටම

ගමේ පාසැල් යන ළමුන් 77 ක් සිටී. ඉන් 47 ක් ගැහැණු ළමුන් වන අතර පිරිමි ළමුන් සංඛ්‍යාව 30 දෙනෙකි. මේ ගමෙහි අකුරු නොදත් අය සිටියේ 13 දෙනෙක් පමණි. ප්‍රධාන නගරවලට ආසන්නව පිහිටා ඇති ගමක් නිසාවෙන් ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලබාගැනීමට ඔවුන්ට පහසුකම් තිබීම එයට ප්‍රධාන හේතුවයි.

2.7 රැකියා ස්වභාවය හා ජීවන මාර්ග

ගමේ වැඩි කොටසකගේ ප්‍රධාන ජීවන මාර්ගය වන්නේ ගොවිතැනයි. රජයේ රැකියාවල නියුක්තව ඉන්නා සංඛ්‍යාව 10 දෙනෙකි. පෞද්ගලික ආයතනවල 16 දෙනෙකු රැකියා කරති. ප්‍රධාන වශයෙන් ජීවන මාර්ගයක් ලෙස ගොවිතැන තෝරාගත් සංඛ්‍යාව 109 දෙනෙකි. ගමෙහි රැකීරක්ෂා පිළිබඳව තොරතුරු වගු 2.3 න් දැක්වේ.

2. 3 වගුව - රැකීරක්ෂා.

| | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|
| රජයේ රැකියාවල නියුතු සංඛ්‍යාව | 03 | 07 | 10 |
| පෞද්ගලික ආයතනවල රැකියා | 10 | 06 | 16 |
| ගොවිතැන | 20 | 89 | 109 |
| ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන | 35 | 30 | 65 |
| ස්වයං රැකියා | 01 | 02 | 03 |
| ව්‍යාපාර | - | 01 | 01 |
| විදේශ රැකියා | 09 | 01 | 10 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

## 2.8 නිවාසවල තත්ත්වය හා උපකරණවල අයිතිය.

ගමේ නිවාස 104 කි. ඉන් 64 ක් උළු සෙවිලි කර ඇති අතර 17ක් ඇස්බැස්ටෝස් ද, 11 ක් තහඩු ද සෙවිලි කර ඇත. නිවාස 12 කට සෙවිලි කර ඇත්තේ පොල් අතු වන අතර කටුමැටි බිත්ති සහිත තාවකාලික තත්ත්වයේ නිවාස සංඛ්‍යාව 14 කි. ගම හරහා විදුලි රැහැන් පද්ධතියක් තිබුණත් විදුලිබල පහසුකම් ලබාගෙන ඇත්තේ නිවාස 40 ක් (39%) පමණි. කිසිම නිවසකට නළ ජල පහසුකම් නොමැත. ප්‍රවාහන මාධ්‍ය වශයෙන් යතුරුපැදි 22 ක් මෙම ගම්වැසියන්ට අයත්ව තිබුනි. එසේම රෝද දෙකේ ට්‍රැක්ටර් 02, ලොරි රථ 02 ක්, ත්‍රිරෝද රථ 01 ක් හා වෑන් රථයක් ගමට ඇති පෞද්ගලික සම්පත් ලෙස දක්නට ලැබුනි.

## 2.9 සනීපාරක්ෂක හා වෙනත් පහසුකම්.

ගම්වැසියන් පානීය ජලය ලබාගන්නා ප්‍රධාන මාර්ගය වනුයේ පෞද්ගලික ලිං වේ. ස්නානය හා රෙදිපිළි සේදීම වැනි කාර්යයන් සඳහා බොහෝ විට භාවිතා කරන්නේ ජය ගඟයි. නිවාස 84 (85%) කට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ඇත. ඉතිරි නිවාස 20 ක පවුල් භාවිතා කරන්නේ තාවකාලිකව ගොඩනගාගත් වැසිකිළි ය.

## 2.10 ඉඩම් අයිතිය හා භුක්තිය

භූමි සම්පත කඩියන්ගල්ල ගමේ ප්‍රධාන භෞතික සම්පතයි. ගමේ මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 375 ක් වන අතර ඉන් අක්කර 326 ක් ගොඩ ඉඩම් ය. කුඹුරු ඉඩම් ඇත්තේ අක්කර 47 ක් පමණි. ගොඩ ඉඩම් ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 196 ක් රජය සතුව වන අතර ඉන් අක්කර 20 ක් රජයේ රක්ෂිත ඉඩමකි. අක්කර 130 ක් වූ පෞද්ගලික ගොඩඉඩම් ප්‍රමාණයෙන් ක්‍රමානුකූලව වගාවන්ට යොදාගෙන ඇත්තේ සුළු ඉඩම් ප්‍රමාණයක් පමණි. ජල හිඟය හා ඉඩම් සකස් කිරීම පිළිබඳව ඇති නොදැනුවත්කම එයට ප්‍රධාන හේතුව බව දැනගන්නට ලැබුනි. ක්‍රමවත් ජල පහසුකම් ලැබේ නම් විශාල ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමේ හැකියාව ඇති බව දක්නට ලැබුනි.

## 2.11 කෘෂිකාර්මික කටයුතු සහ සත්ව පාලනය.

කඩියන්ගල්ල ගමේ පිහිටා ඇති කුඩා වැව් යටතේ පෝෂණය වන කුඹුරු ප්‍රමාණය අක්කර 47 ක් පමණි. මේ වැව්වලට ස්ථිර ජල මාර්ගයක් නොමැති වීමෙන් වැස්සෙන් පමණක් එකතු වන ජලය භාවිතා කරමින් නිසා කන්න දෙකම වගා කිරීමට හැකියාවක් ගොවීන්ට නොමැත. පෞද්ගලික වගා ලිං 03 ක් යටතේ අක්කර 10 ක පමණ වගාවන් සිදු කරයි. වී වගාව සිදු කරන්නේ මහ කන්නයේ පමණි. ගොඩ ඉඩම්වල අඹ, කජු, කෙසෙල්, මඤ්ඤොක්කා, පැපොල් වැනි බෝග වර්ග මෙන්ම අතිරේක බෝග ද වගා කරනු ලබයි. රජයට අයත් ඉඩම්වල හේන් වගාව යටතේ එළවළු, තල,

කුරක්කන්, බඩ ඉරිඟු වැනි බෝග වගා කරනු දක්නට ලැබුනි. කුරහන් හා තල මේ ප්‍රදේශයේ හේන් යටතේ වගා කරන ප්‍රධාන බෝගයන් දෙකකි. කුරහන් අස්වනු තම පරිභෝජනය සඳහා ම තබා ගැනීමට බොහෝ ගැමියන් පුරුදු වී ඇත. ප්‍රදේශයේ අක්කර 80 ක පමණ ප්‍රමාණයක හේන් වගාව සිදු කරනු ලබයි.

2.4 වගුව - සාමාන්‍යයෙන් වසරක් තුළ දී වගා කරන හේන් බෝග වර්ග හා ඉන් ලැබෙන අස්වනු ප්‍රමාණයන්

| බෝගය | වගා කරන බිම් ප්‍රමාණය | සාමාන්‍ය අස්වැන්න (කි.ග්‍රෑම්) |
|---|---|---|
| කුරක්කන් | අක්කර 70 | 42000 |
| තල | අක්කර 65 | 39000 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

ගමෙහි කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමට ඇත්තේ කි.මීටර් 2 ක් පමණ දුරින් පිහිටා ඇති ගෝනපතිරාව නගරයයි. මීට අමතරව ගමට පැමිණෙන වෙළඳුන්ට ද ඒවා අලෙවි කරනු ලබයි. අස්වනු නෙලන සමයේ දී විශාල වශයෙන් මිල අඩුවීම වගාව කෙරෙහි ගොවීන් අධෛර්යමත් කිරීමට ප්‍රධාන හේතුවක් වී ඇත.

කෘෂි ව්‍යාප්ත සේවයේ සහාය මෙම ගම්මුන්ට ලැබෙන්නේ අල්ප වශයෙනි. මේ අතර ගොවීන් මුහුණ දෙන බලවත් ප්‍රශ්නයක් වන්නේ වල් අලි උවදුරයි. එම නිසා දිවා රාත්‍රී දැඩි වෙහෙසක් දරමින් තම වගාවන් රැක ගැනීමට ඔවුන්ට සිදුවී ඇත.

අතිරේක ආදායම් මාර්ගයක් වශයෙන් සත්ව පාලනයේ යෙදී ඉන්නේ පවුල් 09 ක් පමණි. ඉන් පවුල් 04 ක් ගව පාලනයේ ද, පවුල් 02 ක් එළුවන් ඇති කිරීමේ ද නියැලී සිටී. පවුල් 3 ක් විශාල ප්‍රමාණයෙන් කුකුල් පාලනයේ යෙදී සිටී.

2.5 වගුව - සත්ව පාලනයේ යෙදී සිටින පවුල් සංඛ්‍යාව සහ සතුන් ප්‍රමාණය

| | පවුල් ගණන | සතුන් ගණන |
|---|---|---|
| ගව පාලනය | - 04 | 35 |
| එළු පාලනය | 02 | 12 |
| කුකුලන් ඇති කිරීම | - 03 | 3000 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

මෙම ප්‍රදේශයේ නියං සමයන්හිදී ජලය සැපයීමේ අපහසුතාවයත්, පශු වෛද්‍ය සේවය හා තාක්ෂණ උපදෙස් නොලැබීමත් හේතුවෙන් සත්ව පාලනයට උනන්දුවක් නොදක්වන බව අනාවරණය විය.

## 2.12.ගමේ සම්පත් හා ප්‍රවනතා විශ්ලේෂණය.

ගමේ සම්පත් හා සංවර්ධන ප්‍රවනතා පිළිබඳව අදහස් විමසීමේ දී ප්‍රවනතා විශ්ලේෂණය හා හරස්කඩ චාර්කා සිතියම ඒ සඳහා උපයෝගී කරගන්නා ලදී. මෙමගින් ජනගහණය, කැලෑ, වන සතුන්, පවුල් සංඛ්‍යාව, සත්ව පාලනය, රැකියා ව්‍යාප්ත වීම වැනි තොරතුරු කාලයත් සමග වෙනස් වී ඇති අන්දම පෙන්නුම් කරයි.

රූප සටහන් අංක 1 . කඩියන්ගල්ල ගමේ ප්‍රවනතා විශ්ලේෂණය - 1985 - 2005

| | 1985 | 1995 | 2005 |
|---|---|---|---|
| කැලෑව | xxxx | xxx | xx |
| පවුල් සංඛ්‍යාව | xx | xxx | xxxx |
| හේන් වගා ප්‍රමාණය | x | xx | xxx |
| අලි උවදුර | - | xx | xxxx |
| කුඹුරු වගාව | xxxx | xxxxxx | xxxxxxx |
| මී ගව | xxxxxx | xxxxxx | xxxx |
| එළ ගව | xxxxxxxx | xxxxxxxx | xxxx |
| වගා ළිං | - | - | x |
| රජයේ රැකියා | - | xxx | xxxxxx |
| විදේශ රැකියා | - | xx | xxxxx |
| මත්පැන් පානය | - | xx | xxx |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

## 2.13 කඩියන්ගල්ල ගමේ හඳුනාගත් ප්‍රධාන කෘෂිකාර්මික ගැටළු

කඩියන්ගල්ල ගමේ ගොවීන් මුහුණ දෙන කෘෂිකර්මාන්තයට බලපාන ප්‍රධාන ගැටළු පිළිබඳ ගොවීන් සමග කල සාකච්ඡාවේ දී ගැටළු රාශියක් අනාවරණය විය. එම ගැටළු ද්විත්ව යුගල සැසඳුම් ක්‍රමය භාවිතයෙන් ප්‍රමුඛතා ගත කරන ලදී. ඒ අනුව හඳුනාගත් ගැටළු ප්‍රමුඛතාවය මත මෙසේ දැක්විය හැකිය.

1. කෘෂිකාර්මික කටයුතු සඳහා ජල හිඟය
2. කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොමැතිවීම
3. ගුණාත්මක බීජ හා රෝපන ද්‍රව්‍ය නොමැතිවීම
4. ආර්ථික අපහසුතා
5. තාක්ෂණ උපදෙස් නොලැබීම


6. ගොවීන්ගේ ඒකරාශිබවක් නොමැතිවීම
7. වල් අලි හානි
8. කෘෂි පාරවල් නොමැතිවීම
9. විදුලි බලය නොමැතිවීම
10. මත්ද්‍රව්‍ය උවදුර

රූප සටහන් අංක 2. හඳුනාගත් ගැටළු පිළිබඳව ද්විත්ව යුගල සැසඳීම

| ගැටළු / ගැටළු | ජල හිඟය | කෘෂි නිෂ්පාදනවලට සාධාරණ මිල නොලැබීම | වල් අලි හානි | කෘෂිකාර්මික පාරවල් නොමැතිවීම | මත්ද්‍රව්‍ය උවදුර | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නැතිකම | තාක්ෂණ උපදෙස් නොලැබීම | විදුලිබලය නොලැබීම | ආර්ථික අපහසුතා | ඒකරාශී නොවීම | එකතුව | ශ්‍රේණිගතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජල හිඟය | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 9 | 1 |
| කෘෂි නිෂ්පාදනවලට සාධාරණ මිල නොලැබීම | | | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 8 | 2 |
| වල් අලි හානි | | | | 3 | 3 | 6 | 7 | 3 | 9 | 10 | 3 | 7 |
| කෘෂිකාර්මික පාරවල් නොමැතිවීම | | | | | 4 | 6 | 7 | 4 | 9 | 10 | 2 | 8 |
| මත්ද්‍රව්‍ය උවදුර | | | | | | 6 | 7 | 8 | 9 | 10 | 0 | 10 |
| ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නැතිකම | | | | | | | 6 | 6 | 6 | 6 | 7 | 3 |
| තාක්ෂණ උපදෙස් නොලැබීම | | | | | | | | 7 | 9 | 7 | 5 | 5 |
| විදුලිබලය නොලැබීම | | | | | | | | | 9 | 10 | 1 | 9 |
| ආර්ථික අපහසුතා | | | | | | | | | | 9 | 6 | 4 |
| ඒකරාශී නොවීම | | | | | | | | | | | 4 | 6 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

රූප සටහන් අංක 3 - සමිති සමාගම්වල සාමාජිකත්වය





සටහන.

සමිතිවල සාමාජිකත්වය සංඛ්‍යාවලින් දක්වයි.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

රූප සටහන් අංක 4 - කඩියන්වල ගමට සේවා සපයන රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන


ගමට සේවා සපයන ආයතන




සටහන - ආයතනවලින් සිදුවන සේවාවන්ගේ වැදගත්කම අනුව අංකනය කර ඇත.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

රූප සටහන් අංක 5. වර්ෂාපතන රටාව - කඩියන්ගල්ල




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

රූප සටහන් අංක 6 - වාර්ෂික උෂ්ණත්වය - කඩියන්ගල්ල





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු



21245

HARTI

රූප සටහන් අංක 07- වගා කාල සටහන - කඩියන්ගල්ල.




රූප සටහන් අංක 08 කඩියන්ගල්ල හරස්කඩ වාර්කාව




| | A | B | C | D | E | F | G | H | I | J | K | L |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වගා රටාව | බහු බෝග | බහු බෝග | ගෙවතු වගා | පැපොල් ගෙවතු | තේක්ක | වී/ එළවළු | ගෙවතු | ගෙවතු | ලදු කැලෑ | ගෙවතු | ගෙවතු | පැපොල් ගෙවතු වී |
| පස | රතු දුඹුරු | රතු දුඹුරු | රතු | රතු | රතු | රතු | කුඩුගල් සහිත | මැටි | මැටි සහිත දුඹුරු පස | රතු දුඹුරු | රතු දුඹුරු | වැලි මිශ්‍ර පස |
| ගස් | මාර කොහොඹ සියඹලා | අඹ | ලදුකැලෑ | අඹ | තේක්ක අඹ | ලදු | මාර කොහොඹ | මාර තෘණ වගාව | දිවුල් තේක්ක | අඹ පොල් තේක් ක | පොල් කොස් | පොල් තේක්ක |
| ජලය | වැව | ළිං | | වැසි ජල ටැංකි | | වැව | භූගත ජලය | ජය ගඟ | යෝධ ඇල | වැසි ජල ටැංකි | භූගත ජලය ජයගඟ | භූගත ජලය |
| සත්ව පාලනය | | කුකුලන් | | | | | ගවයන් | | ගවයන් | | | එළු පාලනය කුකුල් පාලනය |
| සම්පත් | කුඹුරු | විදුලිය | විදුලිය | තෘණ වගාව විදුලිය | ඉඩම් | ගොඩ ඉඩම් | කුඹුරු | භූමිය, ගොම, පිදුරු | ගල් ඉඩම් | භූමිය | භූමිය | |
| විභවතාවය | ඉඩම් | - | සත්ව පාලනය | සත්ව පාලනය | | සත්ව පාලනය | | ජල සම්පත යටතේ වගා කළ හැක | ඉඩම් (වගා කළ හැකි) | වගා කළ හැකි ඉඩම් | බෝග වගා සත්ව පාලනය | ඉඩම් (වගා කල භූමි) සත්ව පාලනය |
| වර්තමාන භාවිතය | වී වගාව එළවළු වගාව | ගෙවතු වගාව | | එළවළු වගාව | | | | එළවළු ගෙවතු | ගෙවතු වගා | ගේන් වගාව | ගෙවතු වගා සත්ව පාලනය | |
| ගැටළු | අලි වැව ගොඩවීම ජල හිඟය | අලි ජලය | හොඳ සතුන් නොමැතිවීම | අලි | ජල හිඟය අලි | | ජල හිඟය | ජල හිඟය | ජල හිඟය | ජල හිඟය | ජල හිඟය | ජල හිඟය හොඳ සතුන් නැතිකම |
| විසඳුම් | වැව් තාවුල්ල වගාව තහනම් කිරම | ජල පොම්ප දැමීම | හොඳ සතුන් ලබාදීම | වගා ළිං ලබා දීම | | | ජල පොම්ප ලබාදීම | උස්සාන වාර ඇතිකිර ම | ජල පොම්ප ලබාදීම යෝධ ඇලෙන් ජලය ලබාදීම | | ජල සංරක්ෂණ කටයුතු ඇතිකිරම | හොඳ සතුන් ලබාදීම ජල පොම්ප ලබාදීම |

රූප සටහන් අංක 09. කඩියන්ගල්ල ගැටලු ගස




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

රූප සටහන් අංක 10. අරමුණු ගස - කඩියන්ගල්ල ගම




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

2.14 ක්‍රියාකාර සැලැස්ම - කඩියන්ගල්ල ගම

2.14.1. වී වගාව - කඩියන්ගල්ල ගම


අරමුණු : වසර 2 ක් තුල වී වගාවේ අස්වැන්න අක්කරයකට බුසල් 80 සිට 110 දක්වා ඉහළ නැංවීම

| ගැටලුව | විසඳුම | ක්‍රියාකාරකම | කාල රාමුව | වගකීම | පිරිවැය |
|---|---|---|---|---|---|
| ජල හිඟය | ජලය ලබාදීමේ වැඩ පිළිවෙලවල් සකස් කිරීම | වැව පිළිසකර කිරීම<br>වැව් තාවුල්ලේ වගා කිරීම පිළිබඳව ගොවි සංවිධානය විසින් ගොවීන් දැනුවත් කිරීම | 2006 වසර | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>ගොවි සංවිධාන ප්‍රාදේශීය ලේකම් | |
| අලෙවි ගැටලු | අලෙවි පහසුකම් ඇති කිරීම | වෙළඳපොල අනුව වගා කිරීම හඳුන්වාදීම, ගුණාත්මක නිෂ්පාදන සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීම<br>වෙළඳපල අනුව වගාවන් කිරීම හඳුන්වා දීම<br>අගය එකතුකල නිෂ්පාදන හඳුන්වා දීම | 2006 වසර | කෘෂිකර්ම උපදේශක<br>පසු අස්වනු ආයතනය<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>පුද්ගලික ආයතන<br>පසු අස්වනු ආයතනය | |
| තාක්ෂණ උපදෙස් නොලැබීම | උපදෙස් ලබාදීම | තාක්ෂණ උපදෙස් අනුව වගාවට යොමු කිරීම<br>1. ගුණාත්මක බීජ<br>2. පොහොර භාවිතය<br>3. ඒකාබද්ධ පලිබෝධනාශක<br>4. ආදර්ශන<br>5. ක්ෂේත්‍ර චාරිකා | 2006/2007 මහ කන්නයට පෙර | කෘෂිකර්ම උපදේශක<br>කෘ.ප.නි.ස.<br>ගොවි සංවිධානය<br>ගොවිජන සංවර්ධන නිලධාරී. | |

2.14.2 - අතිරේක බෝග - කඩියන්ගල්ල ගම

අරමුණ - කන්නයක ආදායම 2007 යල කන්නයේ දී රු. 60000/- සිට රු. 80000/- දක්වා ඉහළ නැංවීම

| ගැටලුව | විසඳුම | ක්‍රියාකාරකම | කාල රාමුව | වගා කිරීම | පිරිවැය |
|---|---|---|---|---|---|
| 1. ජල හිඟය | ජලය ලබාදීම<br>ජල සංරක්ෂණය | වගා ලිං ලබා දීම<br>මසුන් යෙදීම<br>බිංදු ජල සම්පාදනය<br>වැසි ජලය එකතු කිරීම<br>පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ පුහුණු | 2006 වසර තුල<br>2006 යල<br>2007<br>2006 අගෝස්තු | පලාත් සභා<br>කෘෂි උපදේශක<br>කෘෂි උපදේශක<br>කෘෂි උපදේශක<br>ගොවි සංවිධාන<br>කෘ.ප.නි.ස. | |
| 2. තාක්ෂණ උපදෙස් නොලැබීම | උපදෙස් ලබාදීම | කුඩා කණ්ඩායම් ඇති කිරීම | 2006 අගෝස්තු | කෘෂිකර්ම උපදේශක<br>ගොවි සංවිධාන<br>කෘ.ප.නි.ස. | |
| 3. ඒකරාශිවීම අඩුවීම | දැනුවත් කිරීම | 1. සහභාගිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>2. ගොවි සංවිධානය ශක්තිමත් කිරීම<br>3. කුඩා කණ්ඩායම් ඇති කිරීම | 2006 මැයි<br><br>2006 අගෝස්තු<br><br>2006 මැයි/ජූනි | ගොවි සංවර්ධන නිලධාරීන්<br>කෘ.ප.නි.ස.<br>ගොවි සංවර්ධන නිලධාරීන්<br>කෘ.ප.නි.ස.<br>ගොවි සංවර්ධන නිලධාරීන්<br>කෘ.ප.නි.ස. | |
| 4. මූල්‍ය පහසුකම් නැතිකම | මුදල් ලබාගැනීමේ පහසුකම් ඇති කිරීම | චක්‍රීය අරමුදල් ඇතිකිරීම<br><br>බැංකු සමග සාකච්ඡා කර ණය ගැනීම පහසු කිරීම | 2006/07 මහ | ගොවිජන සංවර්ධන නිලධාරීන්<br>කෘ.ප.නි.ස. | |
| 5. වල් අලි හානිය | හානිය වැලැක්වීම | වන ජීවී දෙපාර්තමේන්තුවේ සහාය ලබාගැනීම | 2006/07 මහ | ප්‍රාදේශීය ලේකම් | |



රූප සටහන් අංක 11- කඩියන්ගල්ල ගමෙහි සිතියම    මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු

- නිවාසය
- පන්සල

## තුන්වන පරිච්ඡේදය
## පුලියන්කුලම ගම්මානය

### 3.1 පිහිටීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 498 සංගට්ටැව ග්‍රාම නිලධාරි වසම තුළ පුලියන්කුලම ගම්මානය පිහිටා ඇත.

### 3.2 ඉතිහාසය හා කාල රේඛාව

පුලියන්කුලම ගම්මානයේ ඉතිහාසය එතරම් දිගු ඈතකට විහිදෙන බවට නිශ්චිත තොරතුරු නොමැති අතර, 1940 දී පමණ හේන වගාව ආරම්භයත් සමග මෙම ගමෙහි ආරම්භය ද සිදු වූ බව ගම්මුන් ප්‍රකාශ කරයි. පුලියන්කුලම වැව ආශ්‍රයෙන් ගම්මානය බිහි වූ බැවින් පුලියන්කුලම නම ගම්මානය සඳහා ද ව්‍යවහාර වී ඇත.

කාල රේඛාව

| | |
|---|---|
| 1940 | හේන වගාව සමග ගම ආරම්භ වීම |
| 1950 | හේන වගාවෙන් පසු හේන් වගාව |
| 1978 | ජය ගඟ කැපීම |
| 1982 | බෞද්ධ සමිතිය ආරම්භ වීම |
| 1984 | තරුණසේවා සභාව මගින් පුලියන්කුලම වැව ප්‍රතිසංස්කරණය හා වී වගාව ආරම්භ කිරීම |
| 1985 | ගොවි සංවිධානය ආරම්භ කිරීම |
| 1990 | මරණාධාර සමිතිය ආරම්භ කිරීම |
| 1995 | සමෘද්ධි සමිතිය ආරම්භ වීම |
| 1996 | කෘෂි ළිං කැපීම (තරුණ ගොවිපලේ) |
| 1997 | ජල පොකුණු හෑරීම |
| 1998 | ගොවි සේවන කාර්යාලය පිහිටුවීම |
| 1998 | ගමේ කොටසකට විදුලි බලය ලැබීම |
| 1998 | ක්‍රීඩා සමිතිය ආරම්භ වීම |
| 1998 | කිරි සමිතිය පිහිටුවීම |
| 2000 | ළදරු පාසලේ ආරම්භය |
| 2000 | කාන්තා සමිතිය ආරම්භ වීම |

## 3.3 ජනගහණය හා අධ්‍යාපනය.

ගමේ මුළු පවුල් සංඛ්‍යාව 211 ක් වන අතර මුළු ජනගහණය 770 කි. එය ස්ත්‍රී 405 ක් හා පුරුෂ 365 ක් වශයෙන් බෙදී පවතී. ජාතීන් වශයෙන් ගත් විට පවුල් 210 ක් සිංහල වන අතර එක් පවුලක් පමණක් මුස්ලිම් ජාතිකයින් වේ.

වයස් ව්‍යුහය අනුව ජනගහණය සලකා බැලීමේ දී අවුරුදු 18 ත් 35 ත් අතර පුද්ගලයින් සංඛ්‍යාව 34% කි. වයස් ව්‍යුහය අනුව ජනගහණයෙහි ව්‍යාප්තිය පිළිබඳව 3.1 දරණ වගුවෙන් පැහැදිලි විස්තරයක් සපයයි.

3.1 වගුව - වයස් ව්‍යුහය අනුව ජනගහණ ව්‍යාප්තිය - පුලියන්කුලම

| වයස් ව්‍යුහය | ස්ත්‍රී | පුරුෂ | එකතුව | මුළු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 0 - 5 | 31 | 40 | 71 | 9 |
| 6 - 11 | 40 | 37 | 77 | 10 |
| 12 - 17 | 48 | 44 | 92 | 12 |
| 18 - 25 | 79 | 58 | 137 | 18 |
| 26 - 35 | 73 | 71 | 144 | 19 |
| 36 - 55 | 105 | 95 | 200 | 25 |
| 56 - 60 | 6 | 10 | 16 | 2 |
| 61 - 70 | 15 | 5 | 20 | 3 |
| 70 ට වැඩි | 8 | 5 | 13 | 2 |
| එකතුව | 405 | 365 | 770 | 100 |

මූලාශ්‍රය : ග්‍රාම නිලධාරි වාර්තා - පුලියන්කුලම

අධ්‍යාපන මට්ටම පිළිබඳව සැලකීමේ දී 97% ක පමණ වැඩිහිටි සාක්ෂරතාවයක් ගම තුළ පවතී. ගම්මානයේ දැනට පාසල් යන ළමුන් හා පාසල් යාමට සුදුසුකම් නොලැබූ ළමුන් හැර ඉතිරි ජනගහණයෙන් 17% ක් පමණ අ.පො.ස. (සා.පෙළ) හා ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත.

වර්තමානය වන විට පාසල් යන සිසුන් 181 ක් පමණ ගම තුල සිටින අතර, පාසල් යා යුතු වයසේ පසුවන නමුත් පාසල් නොයන ළමුන් 04 දෙනෙකු පමණ ඇත.

## 3.4 රැකියා සහ ආදායම් තත්ත්වය.

පුලියන්කුලම ගම්මානයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තයයි. එසේ නමුත් ගම්මානයේ සේවා නියුක්ත පිරිසෙන් වැඩි කොටසක් මහඉලුප්පල්ලම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපළෙහි කම්කරු හා ඒ ආශ්‍රිත සේවාවන්හි නිරත වේ. මේ හේතුවෙන් රජයේ රැකියාවල නිරත සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී. අංක 3.2 වගුව මගින් ගම්වාසීන්ගේ ආංශික සේවා නියුක්තිය පිළිබඳව විස්තරයක් සපයයි.

3.2 වගුව - ආංශික සේවා නියුක්තිය - පුලියන්කුලම

| රැකියාව | නිරත සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| රජයේ රැකියා | 105 | 41 |
| ගොවිතැන | 67 | 26 |
| සංස්ථා | 11 | 4 |
| ස්වයං රැකියා | 29 | 11 |
| පෞද්ගලික අංශය | 29 | 11 |
| විදේශ රැකියා | 18 | 7 |
| එකතුව | 259 | 100 |

මූලාශ්‍රය - ග්‍රාම නිලධාරි වාර්තා. - පුලියන්කුලම

ගමෙහි මුළු පවුල් සංඛ්‍යාව වන පවුල් 211 න් 48 ක් සමෘද්ධි සහනාධාර ලබයි. සමස්ථයක් ලෙස ගත් විට ගමෙන් බහුතරයක් මැදි ආදායම් මට්ටමෙහි පසුවේ.

## 3.5 කෘෂිකාර්මික කටයුතු.

පුලියන්කුලම ගම්මානයේ කෘෂිකාර්මික කටයුතු ප්‍රධාන කොටස් 04 ක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම්

1. පහත් බිම්වල වී වගාව
2. හේන් වගාව
3. ස්ථාපිත ගෙවතු වගාව
4. කෘෂි ළිං යටතේ සිදු කෙරෙන වගාව වශයෙනි.

වී වගාව ප්‍රධාන ලෙසම පුලියන්කුලම වැව යටතේ හා මහ කන්නයේ දී වැසි ජලය භාවිතයෙන් සිදු වේ. වැව යටතේ අක්කර 37ක් පමණ මහ කන්නයේ වී වගාව සිදුවන අතර, තවත් අක්කර 80 ක් පමණ වැසි ජලය පදනම් කර ගනිමින් වගා කරනු ලැබේ.

වී වගාවේ ඒකක ඵලදාව අක්කරයකට බුසල් 55 - 65 අතර මට්ටමක පවතී. කාබනික පොහොර ලෙස ගැනෙන ගොම, පිදුරු වැනි ද්‍රව්‍ය වගාවට යෙදීම කෙරෙහි ගොවීන්ගේ උනන්දුව ඉතා පහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම වී වගාව වී හේන් ආකාරයෙන් සිදුවීමක් ද දැකිය හැකිය.

හේන් වගාව සඳහා ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වෙනත් ප්‍රදේශවල මෙන් විශාල වනාන්තර මෙම ප්‍රදේශයෙහි දක්නට නොලැබෙන අතර, කුඩා ලඳු කැළෑ හෙළිපෙහෙලි කර මහ කන්නයේ දී හේන් වගාව සිදු කරයි. මේ යටතේ මුං, කව්පි, උඳු, සෝයා වැනි භෝග මෙන්ම එළවළු වගාව ද සිදුවේ.

ස්ථාපිත ගෙවතු වගාවන් වශයෙන් ස්ථිර භෝග හා බහුවාර්ෂික භෝග වගාවන් දක්නට ලැබේ. මේ යටතේ දෙහි, දොඩම්. අඹ, ගස්ලබු, පොල් වැනි වගාවන් සිදුවන අතර මේවා බොහෝ විට තම යැපුම් අවශ්‍යතාවන් පදනම් කරගනිමින් වගා කරනු ලැබේ.

කෘෂි ළිං යටතේ වගා කටයුතු යල මහ දෙකන්නයේම සිදුවේ. විශේෂයෙන්ම ගම තුළ පිහිටා ඇති තරුණ මිත්‍රත්ව ගොවිපල තුල කෘෂි ළිං 48 ක් පමණ ඇති අතර ඒ යටතේ එළවළු, පළතුරු වගාවන් වැඩි වශයෙන් සිදු වේ. විශේෂයෙන්ම කරවිල, බණ්ඩක්කා, බටු, ගෝවා, වැටකොළු, පිපිඤ්ඤා, තක්කාලි, ලොකු ලූනු, ගස්ලබු, කෙසෙල් වැනි වගාවන් මේ යටතේ වැඩි වශයෙන් වගාවේ.

## 3.6 මාර්ග පද්ධතිය හා භෞතික යටිතල පහසුකම්.

### 3.6.1 මාර්ග පද්ධතිය

ගම්මානයේ මාර්ග පද්ධතිය ප්‍රධාන ලෙසම ගුරුපාරවලින් සැකසී ඇත.

### 3.6.2 භෞතික යටිතල පහසුකම්.

### 3.6.2.1 ජල සම්පාදන ක්‍රම (කෘෂිකාර්මික කටයුතු සඳහා)

කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය යටතේ වී වගාව සඳහා පුලියන්කුලම වැව ආශ්‍රයෙන් ජලය සපයා ගන්නා අතර එළවළු, පළතුරු වැනි ගොඩ භෝග වගාවන් සඳහා ගම තුල සකසා ගෙන ඇති කෘෂි ළිං මගින් ජලය සපයා ගනී.

### 3.6.2.2.ජල සම්පාදන ක්‍රම. (සාමාන්‍ය භාවිතය)

එදිනෙදා සාමාන්‍ය අවශ්‍යතාවයන් වන නෑම, රෙදි සේදීම වැනි කටයුතු සඳහා අවශ්‍ය ජලය ජය ගඟ හා පුලියන්කුලම වැව ආශ්‍රයෙන් ලබා ගන්නා අතර පානීය ජල අවශ්‍යතාව ගම තුල ඇති පොදු ළිං වලින් හා නළ ළිං වලින් සපුරා ගනී.

### 3.6.2.3 නිවාස හා වැසිකිළි පහසුකම්.

ගම්මානයේ මුළු නිවාස සංඛ්‍යාව වන නිවාස 211 න් 99 ක් ස්ථිර විධිමත්ව සැකසූ නිවාස වන අතර ඉතිරිය අර්ධ ස්ථිර හා තාවකාලික මට්ටමේ නිවාස වේ. ගම තුළ පිහිටි නිවාස 66 ක් විදුලි බල පහසුකම් සපයා ගෙන ඇති අතර එය මුළු නිවාස සංඛ්‍යාවෙන් 31% ක ප්‍රමාණයකි.

සනීපාරක්ෂක කටයුතු සම්බන්ධව සැලකීමේ දී නිවාස 91 ක (43%) ජල මුද්‍රිත වැසිකිළි ද, නිවාස 90 ක (43%) වල වැසිකිළි ද දක්නට ලැබේ. පවුල් 30 ක් (14%) වැසිකිළි සකසා ගෙන නොමැත.

### 3.6.2.4 කෘෂි උපකරණ, යන්ත්‍රසූත්‍ර හා වාහන.

ගම්වැසියන් සතුව පවත්නා කෘෂි උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා වාහන සංඛ්‍යාත්මකව පහතින් දැක්වේ.

| | |
|---|---|
| රෝද 2 අත් ට්‍රැක්ටර් | 06 |
| රෝද 4 ට්‍රැක්ටර් | 01 |
| ලොරි | 02 |
| ත්‍රිරෝද රථ | 02 |
| යතුරුපැදි | 44 |

## 3.7 ඉඩම් පරිහරණය හා භුක්තියේ ස්වරූපය.

ගමෙහි මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 560 ක් පමණ වන අතර, එය ගොඩ ඉඩම් අක්කර 450 ක් හා මඩ ඉඩම් (කුඹුරු) අක්කර 110 ක් වශයෙන් බෙදී පවතී.

ගමෙහි ඉඩම් අයිතිය බෙදී ඇති ආකාරය පිළිබඳව අංක 3.3 දරණ වගුවෙන් පැහැදිළි විස්තරයක් ඉදිරිපත් කෙරේ.

3.3 වගුව - ඉඩම් අයිතිය බෙදී ඇති ආකාරය - පුලියන්කුලම

| ඉඩම් ප්‍රමාණය | පවුල් ගණන | % |
|---|---|---|
| 0 > 1/4 | 1 | 0.5 |
| 1/4 > 1/2 | 23 | 11.5 |
| 1/2 > 1 | 75 | 37.7 |
| 1 > 2 | 64 | 32.2 |
| 2 > 5 | 36 | 18.1 |
| එකතුව | 199 | 100 |

මූලාශ්‍රය - ග්‍රාම නිලධාරි වාර්තා - පුලියන්කුලම


වගු අංක 3.3 ට අනුව ගමේ මුළු පවුල් ප්‍රමාණයෙන් 50% කට පමණ අක්කර 01 ට වැඩි ඉඩම් හිමි ය. අක්කර භාගයට අඩුවෙන් හිමි පවුල් ප්‍රතිශතය 12% කි. මෙයින් ඉතා පැහැදිලි වන්නේ සාපේක්ෂව ගම්මානයේ වැඩි පිරිසක් ඉහල ඉඩම් පරිභෝජනයකින් පසුවන බවයි.

## 3.8 ප්‍රජා සංවිධාන

ගම්වාසීන්ගේ විවිධ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඔවුන් විසින්ම ගොඩනගා ගත් ප්‍රජා සංවිධාන කිහිපයක් ගම තුල ඇත. ගමට සිදුවන සේවාවේ වැදගත්කම අනුව එකී සංවිධාන ප්‍රමුඛතාගත කළ අයුරින් පහත දැක්වේ.

1. මරණාධාර සමිතිය
2. ගොවි සමිතිය
3. කිරි සමිතිය
4. සමෘද්ධි සමිතිය
5. බෞද්ධ සමිතිය
6. කාන්තා සමිතිය
7. ක්‍රීඩා සමිතිය


රූප සටහන් අංක 12
ගමෙහි පිහිටි ප්‍රජා සංවිධාන මගින් ගමට සිදුවන සේවය දැක්වෙන වෙන් රූප සටහන




සටහන
වෘත්තයන්ගේ ප්‍රමාණයෙන් ගමට සිදුවන සේවයත් ඒවා එකිනෙක කැපී යාම මගින් සාමාජිකත්වය බෙදීයාමත් දැක්වේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 මාර්තු HARTI

රූප සටහන් අංක 13 - ගමට සේවා සපයන ආයතන දැක්වෙන වෙන් රූප සටහන





සටහන

වෘත්තයන්ගේ ප්‍රමාණයෙන් ගමට ලැබිය යුතු සේවාවන්හි වැදගත්කමත් ඒවා ඇඳ ඇති දුර අනුව එම ආයතන ගම හා දක්වන සමීපතාවයත් දැක්වේ.


මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

රූප සටහන් අංක 14 - බෝග වගා කාල සටහන පුලියන්කුලම ගම්මානය




මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

රූපසටහන් අංක 15 - උෂ්ණත්වය හා වර්ෂාපතනය - පුලියන්කුලම




මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI


රූපසටහන් අංක 16 - හරස්කඩ වාර්තාව - පුලියන්කුලම



| ඉඩම්වල ස්වභාවය | ගෙවතු | ගෙවතු/වන වගා | රක්ෂිතය වනවගා/මුඩුබිම් | වැව/මුඩුබිම්/ගෙවතු |
|---|---|---|---|---|
| පස | දුඹුරු/රතු දුඹුරු | කුඹුරු පස් | රතු දුඹුරු | මැටි |
| වගාවන් | කජු, අඹ, කෙසෙල්, තේක්ක, කොස් | වී, කොස්, අඹ | පොල්, පැපොල්, කෙසෙල්, තේක්ක, කජු | පොල්, පැපොල්, එළවළු, කෙසෙල්, වී |
| ගස්වැල් | බුරුත, දිවුල්, සියඹලා, මිල්ල, කැටකාලිය | බුරුත, කොහොඹ, සියඹලා, තේක්ක | තේක්ක, කරඳ, සියඹලා | තේක්ක, පළු, බුරුත |
| සතුන් | එළගව, කුකුල්ලු | එළගව, කුකුල්ලු | එළුවන්, ඌරන් | එළගව |
| සම්පත් | දැව,ගඩොල්, මැටි, ගොම | දැව, පිදුරු, මැටි, ජලය | ඖෂධ ශාක, නළ ළිං, දැව | කෘෂි ළිං, පිදුරු, ජල පොම්ප |
| ඉඩම් පරිහරණය | අක්‍රමවත්, අකාර්යක්ෂම | අක්‍රමවත්, අකාර්යක්ෂම | භාවිතා නොවන ඉඩම් ප්‍රමාණය වැඩියි | භාවිතා නොවන ඉඩම් ප්‍රමාණය වැඩියි |
| ජනගහණය | වැඩි ව්‍යාප්තිය | ශූන්‍ය බව | අඩු ව්‍යාප්තිය | මධ්‍යස්ථ ව්‍යාප්තිය |
| භූගත ජල මට්ටම | අඩි 20 ක් පමණ | අඩි 15 | අඩි 25 - 30 | අඩි 15 |
| විභවතාවයන් | පළතුරු,ගඩොල් කර්මාන්තය, ගෙවතු | වී අස්වනු වැඩි කිරීම | ගෙවතු සංවර්ධනය | එළවළු, පළතුරු, මිරිදිය මසුන්, ගෙවතු වගා |
| සටහන් | සත්ව පාලන හා ගඩොල් කර්මාන්තය දියුණු කළ හැක | දැනුම ලබාදිය යුතුව ඇත | සෝදාපාළුව අවම කළ යුතු වේ. | බාහිර වෙළඳපොලට ගැලපෙන සේ නිපදවිය යුතුය. තාක්ෂණික උපදෙස් ලබාදිය යුතුය. |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

රූප සටහන් අංක 17 : ගම්මාන සිතියම - පුලියන්කුලම



2006.03.17.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය මාර්තු 2006 - HARTI

රූප සටහන් අංක 18 - ප්‍රවනතා විශ්ලේෂණය - පුලියන්කුලම - 1970 - 2006

| විස්තරය | | 1970-1980 | 1980-1990 | 1990-2000 | 2000-2006 |
|---|---|---|---|---|---|
| වනාන්තර | | xxxxxxxxxx | xxxxx | xxx | x |
| වී වගාව | අහස්දිය | අක්කර 50 | අක්කර 35 | අක්කර 115 | අක්කර 115 |
| | මඩට | - | අක්කර 45 | අක්කර 45 | අක්කර 45 |
| වී අස්වැන්න | අහස්දිය | අක්කර 1 ට බුසල් 55 | 40 | 60 | 60 |
| | මඩට | - | 60 | 75 | 80 |
| හේන් වගාව | | අක්කර 100 | 50 | 40 | 25 |
| ස්ථිර බෝග | පොල් | - | අක්කර 05 | අක්කර 08 | අක්කර 10 |
| | අඹ | - | 01 | 40 | 50 |
| | කජු | - | 15 | 25 | 40 |
| | දෙහි | - | 01 | 05 | 10 |
| | පැපොල් | - | 02 | 06 | 15 |
| | කෙසෙල් | - | 02 | 10 | 20 |
| | තේක්ක | - | 04 | 02 | 10 |
| | ඉපිල් ඉපිල් | - | 01 | 01 | 01 |
| වල් අලි හානිය | | xxxx | xxxxxx | xxxxxxxx | xxxxxxxxxx |
| මත්පැන් භාවිතය | | xxxxxxx | xxxxxxxx | xxxxx | xxxxx |
| කිරි ගව පාලනය | | - | - | xx | xxxx |
| ගඩොල් කර්මාන්තය | | x | xxxxx | xx | x |
| ගල්වලවල් | | - | xx | xx | xx |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

### 3.9 . පුලියන්කුලම ගම්මානයේ හඳුනාගත් ගැටළු


1. ජල හිඟය
2. විදුලිබලය නොමැතිකම
3. ගුණාත්මක බීජ හිඟය
4. වල් අලි උවදුර
5. වගා නොකල ඉඩම් පැවතීම
6. මුදල් අපහසුතා
7. අඩු අස්වැන්න
8. අලෙවි දුෂ්කරතා

රූප සටහන් අංක 19 - හඳුනාගත් ගැටළු සඳහා යුගල සැසඳීම.

| ගැටළුව | 1 ජලහිඟය | 2 විදුලිබලය නොමැතිකම | 3 ගුණාත්මක බීජ හිඟය | 4 වල් අලි උවදුර | 5 වගා නොකල ඉඩම් පැවතීම | 6 මුදල් අපහසුතා | 7 අඩු අස්වැන්න | 8 අලෙවි දුෂ්කරතා | එකතුව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ජල හිඟය | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 7 | 1 |
| 2. විදුලිබලය නොමැතිවීම | | | 2 | 2 | 2 | 2 | 7 | 8 | 3 | 5 |
| 3. ගුණාත්මක බීජ හිඟය | | | | 4 | 5 | 6 | 3 | 8 | 1 | 8 |
| 4. වල් අලි උවදුර | | | | | 5 | 6 | 7 | 8 | 1 | 7 |
| 5. වගා නොකළ ඉඩම් | | | | | | 6 | 7 | 8 | 2 | 6 |
| 6. මුදල් අපහසුතා | | | | | | | 6 | 8 | 5 | 3 |
| 7. අඩු අස්වැන්න | | | | | | | | 8 | 3 | 4 |
| 8. අලෙවි දුෂ්කරතා | | | | | | | | | 6 | 2 |


මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 මාර්තු HARTI

රූප සටහන් අංක 20
ගැටළු ගස - පුලියන්කුලම




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 මාර්තු - HARTI

රූප සටහන් අංක 21
අරමුණු ගස - පුලියන්කුලමල



3.10 - ව්‍යාපෘති සැලැස්ම - පුලියන්කුලම

අරමුණ : ඉදිරි වසර 02 තුළ (2006 - 2008) වර්ෂාපෝෂිත වී වගාවේ අස්වැන්න අක්කර එකට බුසල් 60 සිට 80 දක්වා වැඩි කිරීම

| ගැටළුව | විසඳුම | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් | කාලය | වගකීම | පිරිවැය |
|---|---|---|---|---|---|---|
| 1. ජල හිඟය | 1. කන්නයට වගා කිරීම<br>2. කෙටිකාලීන වී ප්‍රභේද භාවිතය<br>3. පිදුරු වසුන භාවිතය | කන්න රැස්වීම් පැවැත්වීම හා වගා කාල සටහන පිළියෙල කර ඒ අනුව කටයුතු කිරීම | 60 | 2006-2007 අගෝස්තු | ගොවි සංවිධානය | - |
| | | B G 250 ස්වයං බීජ ආදර්ශන 10 ක් පැවැත්වීම. (කන්නයට 05 බැගින්) | 60 | 2006-2007 මහ<br>2007-2008 මහ | කෘෂි උපදේශක ගොවි සංවිධානය | රු.10000.00 |
| | | ආදර්ශන 20 ක් පැවැත්වීම. (කන්නයට 10 බැගින්) | 60 | 2006-2007 මහ<br>2007-2008 මහ | කෘ.උ.ගො.සං.<br>කෘ.ප.නි.ස. | රු.10000.00 |
| 2. පස නිසරු බව | 1.ඒකාබද්ධ පැළැටි පෝෂණ ක්‍රමවේදය හඳුන්වා දීම | ආදර්ශන 05බැගින් (කන්නයකට)පැවැත්වීම | 60 | 2006-2007 මහ<br>2007-2008 මහ | කෘ.උ.ගො.සං.<br>කෘ.ප.නි.ස. | රු.10000.00 |
| | | ගොම එකතු කිරීමේ වේදිකා 10 ක් ඉදිකර ක්‍රියාකාරීව නඩත්තු කිරීම | 10 | 2006-2007 මහ | කෘ.උ.ගො.සං.<br>කෘ.ප.නි.ස. | රු. 25,000.00 |
| | | කොළ පොහොර සඳහා ග්ලිසීරියා වගා කිරීමේ එක්දින වැඩසටහනක් පැවැත්වීම | 60 | 2007-2008 මහ | ගො.සං.<br>ග්‍රා.නි.<br>කෘ.ප.නි.ස.<br>කෘ.උ. | රු. 3000.00 |
| | 2. පොහොර කාර්යක්ෂමතාව වැඩිකිරීම | පත්‍ර වර්ණ සටහන භාවිතා කර පොහොර භාවිතයට ගොවීන් හුරු කිරීම | 15 | 2006-2007 මහ | තෝරාගත් ගොවීන් හා කෘ. උ. | - |
| | | කොහොඹ ඇට, කුඩු හා මතුපිට පස් යොදා ගනිමින් පෙර ප්‍රතිකාර කරන ලද යූරියා භාවිතා කිරීම | 10 | 2006-2007 මහ | ගොවීන් හා කෘ. උ. | රු. 2500.00 |

ඇමුණුම් අංක 01

සම්පත් දායකයින්ගේ නාම ලේඛනය

| සම්පත් දායකයාගේ නම | තනතුර |
|---|---|
| තිස්ස වර්ණසූරිය මහතා | ලේකම්, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය |
| වී. කේ. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ,<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය ඩබ්ලිව්. ඒ. ජයසේන මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය ඩබ්.එම්.ඒ.බී. ගිරාගම මහතා | අංශ ප්‍රධාන<br>වාරි ජලපාලන හා ගොවිජන සම්බන්ධතා අංශය<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ජේ.කේ. එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | අංශ ප්‍රධාන<br>කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | අංශ ප්‍රධාන<br>මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආර්.එම්.ඒ.කේ.බී. රත්නායක මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| කේ.ටී. කරුණාතිලක මහතා | විධායක සම්බන්ධීකාරක<br>කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය |
| පී. පියරත්න මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |

| | |
|---|---|
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| එන්.පී.ජී. සමන්ත මහතා | පර්යේෂණ නිලධාරි<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| එන්.එස්.බී. ඇපාකන්ද මහතා | පර්යේෂණ නිලධාරි<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය මර්වින් ජෝශප් මහතා | සම්බන්ධීකරණ නිලධාරි<br>එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන |
| වෛද්‍ය රත්නායක මහතා | නියෝජිත<br>එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන |

ඇමුණුම් අංක 02

පුහුණු ලාභීන්ගේ නම් සහ ලිපිනයන්

| අංකය | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 1 | බී. විජේරත්න මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල. 037 - 2223100 |
| 2 | ඕ. පී. කිත්සිරි මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පුත්තලම. 032 - 2222652 |
| 3 | එන්.පී.සී. ද සිල්වා මහතා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව. 027-2222079 |
| 4 | කේ.කේ. ජයසිංහ මහතා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල 037-2223100 |
| 5 | කේ.එම්.ඒ. සුකුර් මහතා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පුත්තලම. 032- 2285200 |
| 6 | ඩබ්.ඒ. සීලරත්න මයා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල. |
| 7 | එච්.ඒ.ව්.ටී. නවරත්න මයා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහඋස්වැව. 032- 2265220 |
| 8 | ඩී.එම්.එම්. දිසානායක මයා | සහකාර පලාත්කෘෂිකර්ම අධ්‍යක්ෂ | සහකාර පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, දළදාගම, මහව. 037 - 2276029 |
| 9 | එම්.ඒ. විමලවීර මහතා | ප්‍රාදේශීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල. 037- 2223100 |
| 10 | ටී.එස්.එෆ්. කරුණාරත්න මයා | ප්‍රාදේශීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | ගොවිජන කේන්ද්‍රය, කුලියාපිටිය. |
| 11 | එන්.එම්.හීන්කුමාරි මිය | ප්‍රාදේශීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | ගොවිජන කේන්ද්‍රය, පඬුවස්නුවර. |
| 12 | ඩබ්.එම්.සරත් වික්‍රමසිංහ මයා | විෂය භාර නිලධාරි | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොළොන්නරුව |

| | | | |
|---|---|---|---|
| 13 | කේ.ඒ. කමල් ප්‍රේමරත්න මයා | විෂය භාර නිලධාරී | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොළොන්නරුව |
| 14 | එම්. සෙනෙවිරත්න මයා | විෂය භාර නිලධාරී | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොළොන්නරුව |
| 15 | ඒ.ආර්. සුමනබණ්ඩා මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව. 025 - 2224841 |
| 16 | වයි.ඒ.එල්.ඇලිවලතැන්න මයා | විෂය භාර නිලධාරී | සහකාර පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, දළදාගම, මහව. |
| 17 | එස්.එම්. සුමනපාල මහතා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පුත්තලම |
| 18 | බී.එම්.ජ.එස්. බස්නායක මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල. |
| 19 | ජේ.එච්.එම්.සී.පී.ජෝතිරත්න මයා | විෂය භාර නිලධාරී | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුලියාපිටිය. |
| 20 | බී. කේ. තෙන්නකෝන් මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, කුරුණෑගල. |
| 21 | පී. ඒ.ජ.එස්. විජේසේකර මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව. |
| 22 | ටී.එච්. අමරසිංහ මහතා | කෘෂිකර්ම නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව. |
| 23 | ඒ.ඒ.ටී.ආර්. අතාවුද මහතා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, පුලතිසිගම |
| 24 | ර.එම්.ආර්.මල්ලවතිස්ස මහතා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, කෝන්වැව. |
| 25 | ජ.කේ.එන්. චන්ද්‍රලතා මිය | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, තලාව |
| 26 | එම්.එම්. ජනපාල මහතා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, පලුගස්වැව |
| 27 | ඩී.පී. සූරපාල මහතා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, නෑගම්පහ |



HARTI

ඇමුණුම් අංක 03

ක්ෂේත්‍ර අධ්‍යයනය පැවැත්වූ ගම්මාන අනුව සහභාගි වූවන්ගේ නාම ලේඛනය

| කඩියන්ගල්ල ගම | පුලියන්කුලම ගම |
| --- | --- |
| කේ.කේ. ජයසිංහ මහතා | බී. විජේරත්න මයා |
| සරත් වික්‍රමසිංහ මහතා | ඕ. පී. කිත්සිරි මයා |
| එම්. සෙනෙවිරත්න මහතා | එන්. පී. සී. ද සිල්වා මයා |
| එච්.ඒ.වී.ටී. නවරත්න මහතා | කේ.එම්. ඒ. සුකූර් මයා |
| බී.කේ. තෙන්නකෝන් මිය | ඩබ්. ඒ. සීලරත්න මයා |
| ටී.එස්.එෆ්. කරුණාරත්න මයා | ඩී.එම්.එන්. දිසානායක මයා |
| ජී.කේ.එන්. චන්ද්‍රලතා මිය | එන්.එම්. හීන්කුමාරි මිය |
| එම්.ඒ. විමලවීර මයා | කේ.ඒ. කමල් ප්‍රේමරත්න මයා |
| ටී.එච්. අමරසිංහ මයා | වයි. ඒ. එල්. ඇලිව්ලතැන්න මයා |
| පී. ඒ. යූ. එස්. විජේසේකර මහතා | බී.එම්. ජී. එස්. බස්නායක මයා |
| ඒ.ආර්. සුමන බණ්ඩා මහතා | ජේ.එච්.එම්.සී.පී. ජෝතිරත්න මයා |
| ර.එම්.ආර්. මල්ලවතිස්ස මහතා | ඒ.ඒ.ටී.ආර්. අතාවුද මයා |
|  | එම්.එම්. ජිනපාල මයා |
|  | ඩී.පී. සූරපාල මයා |

| සම්පත්දායකයින් | |
| --- | --- |
| ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා | ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා |
| එස්.එම්. ඒ. සමරකෝන් මහතා | ආර්. එල්.එන්. ජයතිස්ස මහතා |
| ගාමිනී රත්නායක මහතා | පී. පියරත්න මහතා |
| එන්.එස්.බී. ඇපාකන්ද මහතා | එන්.පී.ජී. සමන්ත මහතා |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා |

21245